**වර්ෂ 2022 ක් වූ ජූනි මස 23 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 02. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 05. ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 06. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 07. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 08. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 09. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 10. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |
| 11. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 12. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 13. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 14. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |
| 15. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |
| 16. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු මන්ත්‍රී | - | කේ.ඕ සෝමතිලක මහතා |
| 02. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |
| 04. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම**

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

පසුගිය මහා සභා වාර්තාවේ වත්කම් ලේඛනයෙන් ඉවත් කරන ලැයිස්තුවේ බලංතොට කලුගල්පතන සුසාන භූමිය නම් කරලා තියෙනවා.නමුත් ඒ සොහොන භාවිත කරනු ලබන සොහොනක්.එම නිසා එම ඉවත් කරනු ලබන ලැයිස්තුවෙන් බලංතොට කලුගල්පතන සුසාන භූමිය යන වත්කම ඉවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී.පුෂ්පකුමාර මහතා

2022 මැයි මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 මැයි මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

පළාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්යය සඳහා දේපල තක්සේරු කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ
අක්‍රමවත්ව ඉදිකළ තාප්පයක් නිසා මාර්ගය අවහිර වීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022.06.23 දිනට සභා අරමුදල් සංවර්ධන යෝජනා ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වල පවතින ගිනිහට නිලධාරි සේවය,ආදායම් පරික්ෂක සේවය,පෙර පාසල් පාලිකා හා පුස්තකාලයාධිපති සේවය යන තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වල නව කළමනාකරණ සේවා නිලධාරි තනතුරු අනුමත කර ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 ප්‍රාදේශිය ලේකම්,ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,පස්බාගේ කෝරළේ,නාවලපිටිය
මැනුම් ඉල්ලීම් අංකය - KDS/PBK/4/2-24/2022(530) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ
2022.02.24 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරික්ෂණ ඉදිරිපත් කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 10 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 11 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 12 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 13 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 14 සභාපති,මධ්‍යම පරිසර අධිකාරිය,බත්තරමුල්ල
වර්ෂ 1988 අංක 56 දරණ පනතින් හා වර්ෂ 2000 අංක 53 දරණ පනතින් සංශෝධිත වර්ෂ 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරා ඇති බලතල අවලංගු කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 15 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ
2022.04.28 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරික්ෂණ ඉදිරිපත් කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 16 විගණකාධිපති දෙපාර්තමේන්තුව,කොළඹ
පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩණ වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 17 ඉඩම් කොමසාරිස් ජනරාල්,ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,බත්තරමුල්ල
මාපාකන්ද උතුර සුසාන භූමිය පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 18 ඉඩම් කොමසාරිස් ජනරාල්,ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,බත්තරමුල්ල
වැලිගම්පළ සුසාන භූමිය පිහිටි ඉඩම පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 19 විධායක ඉංජිනේරු,මාර්ග සංවර්ධන අධිකාරිය,කඩුගන්නාව
මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා පෙ.ව 10.32 ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

02 - 20 කාර්යභාර ඉංජිනේරු,ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය,කොත්මලේ
මහවැලි ගග හා ජලාශ රක්ෂිතය තුළ නිවාස,හෝටල්,මහල් නිවාස සංකීර්ණ හා උත්සව ශාලා ඉදිකිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 21 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති ඉල්ලීම් යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 22 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර
පස්බාගේ කෝරලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ උඩ පළාත උඩබුලත්ගම කොට්ඨාස දෙකේ උප ප්‍රධාන සංඝනායක ගිනිමැල්ලගහ අමරවංශ ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු:57150.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 23 ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව,කටුගස්තොට පාර,මහනුවර
මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) තනතුරකට කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 24 ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
සභාවට අයත් 252 – 6380 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරිම - පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 25 සභාපති,ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය,කොළඹ 07
විදුලි භාවිතය අවම කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 26 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ

2022 වර්ෂය සඳහා සියලුම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 27 ලේකම්,පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,කොළඹ 02
පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා වන දායකත්වය ඉහළ නැංවීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 28 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ
ප්‍රාදේශීය සභා ආඥා පනතේ 132(ඒ) වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 29 කා.නි අධ්‍යක්ෂ,නාගරික සංවර්ධන අධිකාරිය,බත්තරමුල්ල
කඩියන්ලෙන නගර සංවර්ධන ව්‍යාපෘතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 30 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් පාලිකාවන් සඳහා 2021.12.10 හා 2021.12.11 යන දෙදින තුළ පුහුණු වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් රු:79725.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 31 කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා,කෘෂිකර්ම අමාත්‍යාංශය,බත්තරමුල්ල
පලතුරු වගාව සඳහා කඩියන්ලෙන බෝහිල් වත්ත වතු යායෙන් අක්කර 25 බිම් කොටසක් ලබා ගැනීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 32 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ
සභා අරමුදල් වියදම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරීම**

03 - 01 බී.ඇනා මේරි මිය,වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා,පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
කඩියන්ලෙන ජනපදයේ බෝක්කුවක් අවහිර කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

03 - 02 කඩියන්ලෙන ග්‍රාම සංවර්ධන සමිතිය,කඩියන්ලෙන
කඩියන්ලෙන ජනපද පාර කොන්ක්‍රීට් කිරීමට අවසර ලබා ගැනීමටයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

03 - 03 ලේකම්,බව්වාගම මරණාධාර සමිතිය,බව්වාගම
ශබ්ද විකාශන යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

03 - 03 අයි.ඒ.එච්.ටී බණ්ඩාර මිය,කොට්ඨාසභාර සංවර්ධන නිලධාරි,පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව
නිලූකා ප්‍රියන්ති මහත්මිය විසින් වැලිගම්පළ පදිංචි තම නිවස අවහිර වන ආකාරයේ බැම්ම ඉදිකිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති විරෝධතා ගැටලුව සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 තෙවන හා සිව්වන කාර්තු වලට අයත් අභ්‍යන්තර විගණන සැලැස්ම මේ සමග ඉදිරිපත් කරන අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව 2022 තෙවන හා සිව්වන කාර්තු වලට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 02 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
2022 සභා අරමුදල් වලින් 100,000.00 ක මුදලක් වරකාව ගම මැද මාර්ගයේ ගැලවී ඇති කොන්ක්‍රීට් කොටස් නැවත පිළිසකර කිරිම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සභාව සතු වාහන සඳහා නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය සතු ඉන්ධන පිරවුම්හල් වලින් ඉන්ධන ලබා ගන්නා අතර දැනට පවතින ඉන්ධන හිගය හේතුවෙන් පසුව මුදල් ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා දිය නොහැකි බව එම ආයතනය විසින් අපව දැනුවත් කර ඇති අතර සභාව සතු වාහන සඳහා අඛණ්ඩව ඉන්ධන ලබා ගැනීම සඳහා නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රු:200,000.00 ඇප තැම්පත් මුදලක් තැබීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලට ඉන්ධන ලබා ගන්න විධියක් නෑ.පිට  වාහන තමයි වැඩි.සභාව මගින් මැදිහත් වෙලා අපිට ඉන්ධන ලබා ගන්න අවස්ථාවක් ලබා දුන්නොත් හොඳයි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 04 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
2022 මන්ත්‍රී සභා අරමුදල් වලින් 100,000.00 ක මුදලක් වරකාව ශ්‍රී සුන්දරාරාම විහාරස්ථානයේ පහත මලුවේ කැට ගල් ඇල්ලීම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>

2022 සභා අරමුදල් වලින් 100,000.00 ක මුදලක් වරකාව ගම්සභා පාරේ මුල් කොටස සෑදීම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු මන්ත්‍රී එච්.ඒ.එන්.සී රණසිංහ මහතා</u>
2022 සභා අරමුදල් වලින් රු:200,000.00 මුදලක් ඉඹුල්පිටිය පහළ කොටස ගහ අසලින් දිවෙන පාරේ නඩත්තු කටයුතු සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 07 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>
2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ මා හට ලබා දෙන මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු:20,000.00 මුදලක් ටෙම්පල්ස්ටෝ වත්ත ලකී බෝයිස් ක්‍රීඩා උපකරණ ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 08 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>
රොසැල්ල හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයට අවශ්‍ය කරන වීදුරු,පිඟන් හා පීරිසි කෝප්ප ලබා දීම සඳහා 2022 වර්ෂයේ සභා අරමුදල් වලින් රු:40,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 09 ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
2022 මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන වලින් වැලිගම්පළ ප්‍රජා ශාලාව අලුත්වැඩියා කර ගැනීම සඳහා රු:150,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 10 ගරු මන්ත්‍රී කේ.ඕ කුසුම්ලතා මිය
බෝදාදෙනිය ගමට යන පාරේ නායයන කොටසේ බැම්ම ඉදි කිරිම සදහා මා හට සභාවෙන් ලබා දෙන රු:300,000.00 මුදල ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 11 ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය
ඉහත නම සදහන් මා හට 2022 වර්ෂය සදහා ලබා දෙන ප්‍රතිපාදන වලින් පහත සදහන් යෝජනා ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- නාවලපිටිය කහමාන රංසිමාලාකාරාම විහාරස්ථානයේ පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක හා මේසයක් ලබා ගැනීමට රු: 100,000.00
- නාවලපිටිය ශ්‍රී සුන්දරාරාම පුරාණ විහාරස්ථානයේ කැටගල් ඇල්ලීමට රු: 50,000.00
- නාවලපිටිය පල්ලේගම ශ්‍රී නන්දනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මන්දිරයේ ඉදිකිරිම් වැඩ කටයුතු සදහා රු:70,000.00
- නාවලපිටිය වරකාව වසමේ පත්තුනුපිටිය අවමංගල්‍යාධාර සමිතියට අවශ්‍ය පුටු ලබා දීමට රු: 30,000.00
- පල්ලේගම ප්‍රජා ශාලාවේ දැල් වැටක් ගැසීමට රු:30,000.00
- පත්තුනුපිටිය විද්‍යාලයේ පුස්තකාලයට අවශ්‍ය පොත් ලබා ගැනීමට රු:20,000.00

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාවන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සදහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 12 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන වලින් මා හට ලබා දෙන මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු:50,000.00 මුදලක් ටෙම්පල්ස්ටෝ වත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයට සංවර්ධන කටයුතු සදහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 13 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
2022 වර්ෂය සදහා මා වෙත වෙන් කරන ලද සභා අරමුදල් යටතේ බලංතොට උතුර ප්‍රජා ශාලාව ඉදිකිරිම සදහා රු:50,000.00 මුදලක් ලබා දීම සුදුසු බවත් එම කර්මාන්තය බලංතොට සිංහ ප්‍රජා මණ්ඩලය මගින් ඉටු කිරිම සුදුසු බවටත් මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2020 වර්ෂයට අදාලව ජාතික මූල්‍ය ප්‍රකාශන විගණනය කිරිම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු රු: 197,400.00 මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු රු:197,400.00 විගණන ගාස්තු ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මෙම සභාවට අයත් 252 – 6380 කැබ් රථයේ ඉදිරිපස හා පසුපස ටයර් ගෙවී ඇති බැවින් එම ටයර් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ජාතික පෙර පාසල් සංවර්ධන පදනම මගින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව පෙර පාසල් කළමනාකරණය හා ඵලදායිතා සංකල්පය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා රු:34000.00 මුදලක් වැය වන බව සඳහන් කර තිබෙනවා.ඒ අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2021 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති හා උපමාන පාදක සංවර්ධන ව්‍යාපෘති වලට අදාල ගෙවීම් කටයුතු සඳහා මුදල් ප්‍රතිපූර්ණය නොවන බැවින් ගිවිසුම්ගත සමිති වලින් කරනු ලැබූ ව්‍යාපෘති සඳහා ප්‍රතිපූර්ණය වන තෙක් සභා අරමුදලින් ගෙවීම් කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 18 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
LL 7484 අංක දරණ වාහනයේ කිංපිං ගෙවී ඇති බැවින් හා පසුපස ආසනය අබලන්ව ඇති බැවින් එම දෝෂ සකස් කිරිම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාවන් ක්‍රියාත්මක කිරිම සඳහා මිල ගණන් කැදවා ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 19 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
ප්‍රජා මණ්ඩල සඳහා ලබා දෙන මුදල් වලින් වරකාව ප්‍රජා ශාලාවේ පුස්තකාලය සඳහා කාමරයක් වෙන් කිරිම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022 වර්ෂය සඳහා සභාව සතු ස්ථාවර වත්කම් සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලය පහත පරිදි සකස් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- දිල්රුක් දිසානායක මයා - පරිසර නිලධාරි
- එස්.කේ.ගුණරත්න මයා - තාක්ෂණ නිලධාරි
- එච්.ඒ චාමර මයා - ආදායම් පරික්ෂක
- චමින්ද ප්‍රදීප් මයා - සංවර්ධන නිලධාරි
- බුද්ධිකා ලියන්දෙණිය මිය - සංවර්ධන නිලධාරි
- ප්‍රසාදිනී මැණිකේ මිය - සංවර්ධන නිලධාරි

කොට්ඨාස භාර සංවර්ධන නිලධාරින්

- හිමේෂා තිළිණි බණ්ඩාර මිය
- එච්.එම් නිරූෂා ශ්‍රීමන්ති මෙය
- රුවනි චන්දිමා මිය
- දිල්රුක්ෂි විජේසිංහ මෙය
- සමුදි ජිනාදරී මිය
- සචිනි සෞම්‍යා මෙය

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 21 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඉගුරුඔය දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් පී.පී මහ 770 පිඹුර තුළ පිහිටා ඇති සුසාන භූමියේ මැනුම් ගාස්තු ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සදහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 22 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නො.27,මීපිටිය,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි කේ.ඕ.ජී සචිනිකා දිල්රුක්ෂි මෙය, අංක 35/1,දෙකිද,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ආර්.එම් දේශාන් ළහිරු රත්නායක මයා හා නො.23,ෂෙම්රොක් ජනපදය,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ඩබ්.ඒ.ඩබ්.එම් සදමාලි මෙය යන අය මෙම ආයතනයේ ප්‍රායෝගික පුහුණුව සදහා අවස්ථාවක් ලබා දෙන මෙන් ජාතික තරුණ සේවා සභාව මගින් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව එම ඉල්ලීම පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම සදහා යොමු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සදහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 23 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
169,කැත්දෝපිටිය,වැලිගම්පළ,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ඩී.එම් නිදුකා ප්‍රියදර්ශනි මිය විසින් ඇයගේ දියණියගේ ක්‍රීඩා කෞශල්‍යා ඉහළ නංවා ගැනීම සදහා උපකාරයක් සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.ඇය ඉතාමත් දක්ෂ දරුවෙක්.ජයග්‍රහණ රාශියක් ලබා ගෙන තිබෙනවා.එම නිසා අපි සභාවෙන් ඇයට යම් උපකාරයක් කරන්න ඕනි.මේ සදහා රු:50,000.00 උපරිමයකට යටත්ව යම් උපකාරයක් සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
සභික දීමනාවෙන් යම් මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න බැරිද සභාපතිතුමා.නාවලපිටියටම ලොකු ආඩම්බරයක්.විශේෂ සැලකිල්ලක් දක්වලා අපිට කරන්න පුලුවන් දෙයක් කරමු.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමත් ඒ දරුවට අවශ්‍ය දේවල් ලබා දුන්නා.ඒ වගේම පාසල් සංවර්ධන සමිතියෙනුත් යම් මුදලක් දෙනවා.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සදහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 24 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

පෙරමඟ පෙර පාසල් පාලකාව විසින් ඉල්ලීමක් කරලා තියෙනවා දෙමාපියන්ගෙන් ලබා ගන්නා පෙර පාසල් ගාස්තුව රු:200.00 වැඩි කර ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙස.ඒ අනුව එම ඉල්ලීම පරිදි පෙර පාසල් ගාස්තුව රු:200.00 කින් වැඩිකර ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 25 ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
හෛඩ් ඇතටන් ප්‍රදේශයේ ජල මූලාශ්‍රයේ දැනටමත් ප්‍රදේශවාසින් විසින් අක්‍රමවත් ලෙස ජලය ලබා ගන්නා අතර එහිදි විවිධ ගැටලු වලට මුහුණ දීමට සිදුවේ.එම නිසා එම ජල යෝජනා ක්‍රමය විධිමත් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2022.06.10 දින පවත්වන ලද පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේදී ඉදිරිපත් කරන ලද හරිත ලංකා ජාතික ගෙවතු වගා සංග්‍රාමය 2022 මධ්‍යම පළාත් කෘෂි නවෝදය වැඩසටහනේ ක්‍රියාත්මක සැලැස්ම අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී.පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 27 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මධ්‍යම පරිසර අධිකාරිය විසින් සභාව වෙත යොමු කර ඇති වර්ෂ 1988 අංක 56 දරන පනතින් හා වර්ෂ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත වර්ෂ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරා ඇති බලතල අවලංගු කිරිම යන මැයෙන් වූ ලිපිය මං මේ අවස්ථාවේ ඉදිරිපත් කරන අතර 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වෙනි වගන්තිය යටතේ වූ නියමය අනුව පළාත් පාලන ආයතන වෙත බලය පැවරීම යන මැයෙන් වූ ලිපිය අනුව එකී ලිපියේ අඩංගු කරුණු අනුව කටයුතු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරිම.**</u>

06 - 01 මුදල් කාරක සභාව - 2022.06.15
06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව - 2022.06.10
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.06.16
06 - 04 පරිසර හා පොදු පහසුකම් කාරක සභාව - 2022.06.10
06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.06.10

07. **<u>බැංකු සැසඳුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරිමේ ප්‍රගතිය ඉදිරිපත් කිරිම</u>**

- 2022.05.01 දින සිට 2022.05.31 දක්වා වවුචර් අංක 496 සිට 601 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286
මාසය - 2022 මැයි

| | | | |
|---|---|---|---|
| 2022.05.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: | 5,318,644.15 | |
| එකතු කළා මැයි මස මුළු ලැබීම් | රු: | 3,882,811.43 | |
| අඩු කළා මැයි මස මුළු ගෙවීම් | රු: | 5,451,625.76 | |
| 2022.05.31 දිනට මුදල් පොතේ ශේෂය | | | රු: 3,749,829.82 |
| <u>එකතු කළා</u> | | | |
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: | 655,740.26 | |
| | | | <u>රු: 655,740.26</u> |
| | | | 4,405,570.08 |
| <u>අඩු කළා</u> | | | |
| බැංකු ගාස්තු | රු | 108.00 | |
| අත ඉතිරි මුදල් | රු: | 12,779.00 | |
| | | | <u>රු: 12,887.00</u> |
| 2022.05.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | **<u>රු:4,392,683.08</u>** |

- 2022 මැයි මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,322,981.99 |
| 02. ගමන් වියදම් | 11,855.00 |
| 03. සැලසුම් හා උපකරණ | 775,060.00 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 182,612.00 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 147,181.41 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 24,099.52 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 12,303.04 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 4,559.00 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **4,480,651.96** |
| 09. ප්‍රාග්ධන වැය | 2,415.00 |
| 10. ණය ආපසු ගෙවීම් | 231,082.34 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **233,497.34** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **4,714,149.30** |
| විවිධ ණය හිමියන් | 466,301.00 |

| | |
|---|---|
| කර්:ණය හිමියන් (309-3-1) | - |
| කර්:ණය හිමියන් (309-3-111) | 139,914.80 |
| කර්:ණය හිමියන් (304-5) | - |
| 10% කර්මාන්ත තැම්පත් | 303,574.57 |
| විවිධ තැම්පත් | 65,880.00 |
| මුද්දර තැම්පත් | - |
| දේපල ණය | 12,864.33 |
| සේවක ණය | - |
| අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | - |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 75,229.00 |
| ජල ගබඩා අත්තිකාරම් | -- |
| අගරු චෙක්පත් | - |
| කර්:ණය ගැතියන් | - |
| **එකතුව** | 1,063,763.70 |
| **2022.05.31 දක්වා මුළු ගෙවීම් එකතුව** | **5,777,913.00** |

- 2022 මැයි මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 223,994.00 |
| 20 කුලී | 111,643.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 17,754.00 |
| 40 සේවා සදහා ගාස්තු | 158,277.00 |
| 50 වරෙන්තු ගාස්තු | 45,315.58 |
| 60 වෙනත් ආදායම් | 248,682.18 |
| 70 වෙනත් ආධාර | 3,021,330.00 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | **3,866,963.72** |
| ජල ණය ගැතියෝ | 1,500.00 |
| ජල තැම්පත් | 2,000.00 |
| මුද්දර | 1,725.00 |
| විවිධ තැම්පත් | 13,068.62 |
| සේවක ණය | 194,482.00 |
| කර්මාන්ත තැම්පත් | - |
| දේපල ණය | 12,864.33 |
| විවිධ ණය ගැතියෝ | 46,790.00 |
| අත්තිකාරම් පියවීම | 67,880.00 |
| අත්තිකාරම් පියවීම ජල ගබඩා | - |
| රු 25 මුද්දර | 1,825.00 |
| සැලසුම් හා උපකරණ | - |

| | |
|---|---|
| කර්මාන්ත ණය ගැතියෝ | - |
| වෙනත් ලැබීම් වල එකතුව | 342,134.95 |
| 2022.05.31 දක්වා මුළු ලැබීම් | **4,209,098.67** |

- 2022 මැයි මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 06
02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 04
03. පොත් බැහැර දීම - 1223
04. ව්‍යාප්ත සේවා -
05. රැස්කළ ආදායම(පුස්තකාල)- 1370.00
(නැණසල) - 4000.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 - 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | ශ්‍රී ලංකා ස්ටෝර්ස් 31, කොත්මලේ පාර ,නාවලපිටිය | සුපර්කොම් ට්‍රේඩින් පුද්ගලික සමාගම | නිව් ජනරල් ට්‍රේඩින් | එල්.එච්.චන්ද්‍ර සේකර පුද්ගලික සමාගම 80 රජවීදිය මහනුවර | පේපලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම 14 හරස් වීදිය මහනුවර |
|---|---|---|---|---|---|
| ඡායා පිටපත් කඩදාසි A4-JK80 GMS | 2950.00 | 2600.00 | 2450.00 | 2899.46 | 2688.00 |
| ඡායා පිටපත් කඩදාසි A4-Dark Colures | 3750.00 | - | - | 3885.00 | 5317.60 |
| ඡායා පිටපත් කඩදාසි A4- Rainbow | 1850.00 | - | - | 1815.00 | 3080.00 |
| ඡායා පිටපත් කඩදාසි A3- JK80 GMS | 4400.00 | - | - | 6240.00 | 5398.40 |
| ඡායා පිටපත් කඩදාසි B5- JK80 JMS | 2150.00 | - | - | - | 1999.20 |
| ඡායා පිටපත් කඩදාසි Legal – JK80 JMS | 3350.00 | - | - | - | 3279.36 |
| පිටපත් සහිත පරිගණක කඩදාසි- A4(දෙපිට) | 13500.00 | - | - | - | 824.32 |
| පරිගණක කඩදාසි-70 gms | 6000.00 | - | - | - | 10584.00 |
| ෆයිල් ලේස් පැකට් | 475.00 | - | 395.50 | 320.00 | 196.00 |
| මැනිලා පේපර්ස් | 40.00 | - | - | - | 121.00 |
| එඩ්මන්ඩ් ෆයිල් | 175.00 | - | 185.00 | 105.48 | 162.40 |
| හාෆ් ශීට් | 175.00 | 1800.00 | | 2080.00 | 1904.00 |
| හයිලයිට් පෑන් | 90.00 | - | 90.00 | 89.29 | 78.40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| Box File(2.5) | 600.00 | - | 490.00 | 546.00 | 672.00 |
| Double A .80 GSM | - | 3000.00 | - | - | - |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය අනුව මිලදී ගැනීම් සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 සභාව සතු 31-9698 දරණ ජීප් රථයේ Recondition එන්ජිමක් සවි කිරිම සඳහා වන අමතර කොටස් මිල දි ගැනිම සදහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | අජ් කන්ට්‍රි මෝටර්ස් | විජය මෝටර්ස් ටෙඩර්ස් | ඕමේගා මෝටර්ස් |
|---|---|---|---|
| ඉංජින් ඔයිල් 6 ලීටර් | 11080.00 | 11200.00 | 11600.00 |
| Brake oil ml | 1900.00 | 2450.00 | 2500.00 |
| Oil Filter | 1850.00 | 1750.00 | 2050.00 |
| Diesel Filter | 2400.00 | 2850.00 | 2875.00 |
| Radiator Cleaner | 250.00 | 650.00 | 680.00 |
| Battery Terminal -04 | 1500.00 | 1500.00 | 2000.00 |
| Clip-04 | 700.00 | 850.00 | 1000.00 |
| 14-Nut & bolt -10 | 750.00 | 800.00 | 1020.00 |
| Cable tickle-10 | 250.00 | 870.00 | 900.00 |
| Installation tape | 90.00 | 150.00 | 180.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය අවම මිල ගණන් සපයා ඇති "අජ්-කන්ට්‍රි මෝටර්ස්, නො52, කොත්මලේ පාර, නාවලපිටිය.". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 03 ජංගම පුස්තකාලය සඳහා ලබා දීමට පුටු,මේස හා වානේ අල්මාරි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | දම්රෝ පුද්ගලික සමාගම | සමගි ෆර්නිචර්ස් | ජයන්ති ටිම්බ ඩිපෝට් | සීතා හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටස් පුද්ගලික සමාගම |
|---|---|---|---|---|---|
| ඇදි රහිත ප්ලාස්ටික් පුටු | 2479.50 | 3186.00 | 3220.00 | 2950.00 | 3200.00 |
| ප්ලාස්ටික් මේස (නිල්කාල්) | - | - | 11000.00 | 9950.00 | - |
| ප්ලාස්ටික් මේස(මා(ර්)වල්) | - | 10800.00 | - | - | 10950.00 |
| මෙලමයින් වීදුරු පුස්තකාල කබඩ් | 54126.25 | 42500.00 | 43200.00 | 46500.00 | 43000.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය අනුව මිලදී ගැනීම් සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 04 සභාව සතු 31-9698 දරණ ජීප් රථය හා 252-6380 දරණ කැබ් රථයට බැටර් මිල දි ගැනිම සඳහා මිල ගණන් කැදවීම.

| විස්තරය | කොත්මලේ ටයර් හවුස් | ටූල්ස් සෙන්ටර් | ස්ටෙනෝර් ටයර් හවුස් |
|---|---|---|---|
| 95Amp Vehicle battery | 38050.00 | 38550.00 | 39000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය අවම මිල ගණන් සපයා ඇති "කොත්මලේ ටයර් හවුස්, ගම්පොළ පාර, නාවලපිටිය". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 05 කර්යාලයේ භාවිතා කරනු ලබන ඡායා පිටපත් යන්ත්‍ර හා මුද්‍රන යන්ත්‍ර සඳහා ටොනර් හා තින්ත මිල දි ගැනිම සඳහා මිළ ගණන් කැදවිම

| විස්තරය | Supercom Trading(pvt)ltd 115/6 D.S Senanayake Veediya, kandy | Computeraje (pvt)ltd 89.D.S.Senanayake Veediya, kandy | Omex Computer Technologies115/3,Pushpadana shopping Complex D.S.Senanayake Veediya, kandy |
|---|---|---|---|
| Epson 774 Ink | 5840.80 | 6048.00 | 6720.00 |
| GI 52 Ink Color | 3600.00 | 10450.00 | 4368.00 |
| GI 53 Ink Black | 3400.00 | 4100.00 | 4368.00 |
| Toner Canon Npg 28 | 9500.00 | 4200.00 | 10000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "Supercom Trading(pvt)ltd 115/6 D.S Senanayake Veediya, kandy". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 06 මුහුණු පහක් සහිත ගණදෙවි ප්‍රතිමාවක් මිල දි ගැනිම සඳහා මිල ගණන් කැදවීම.

| Terra Global Holdings Pvt Ltd,Wattala | Laksala Pvt Ltd,Colombo 12 | Avons Holdings,Colombo 12 |
|---|---|---|
| 400,000.00 | 385,000.00 | 350,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය අවම මිල ගණන් සපයා ඇති "Avons Holdings,Colombo 12". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 07 සාස්පාන් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| ද්‍රව්‍යය | ශ්‍රී ගෞරීස්,වොගන්ස් පාර්ක් පාර,නාවලපිටිය | සාරදාස්,කොත්මලේ පාර,නාවලපිටිය | කැන්ඩි ස්ටෝර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| පියන සහිත සාස්පාන් (15KG) | 8500.00 | 7750.00 | 8250.00 |
| පියන සහිත සාස්පාන් (10KG) | 7500.00 | 6750.00 | 7350.00 |
| තාච්චි ලොකු | 5500.00 | 4650.00 | 4950.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය අවම මිල ගණන් සපයා ඇති "සාරදාස්,කොත්මලේ පාර,නාවලපිටිය". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 08 සභාව සතු 31-9698 දරණ ජීප් රථයේ Wper Arm With Blades මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| ඔමේගා මෝටර්ස්,ගෙලිඔය | විජය මෝටර්ස් ට්‍රේඩර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,මහනුවර | අප් කන්ට්‍රි මෝටර්ස්,නාවලපිටිය |
|---|---|---|
| 13875.00 | 13500.00 | 13000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය අවම මිල ගණන් සපයා ඇති "අප් කන්ට්‍රි මෝටර්ස්,නාවලපිටිය". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 09 ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| ද්‍රව්‍යය | ශ්‍රී ආසිරි හාඩ්වෙයාර්,රඹුක්පිටිය | මහවැලි හාඩ්වෙයාර්,බලංතොට,රඹුක්පිටිය | තෙෂාරා හාඩ්වෙයාර්,නාවලපිටිය |
|---|---|---|---|
| ඇස්බැස්ටෝස් ෂීට් දිග අඩි 10 | - | - | 7200.00 |
| සිමෙන්ති මිටි | - | - | 3000.00 |
| අමානෝ සෙවිලි තහඩු ගේජ් 28 දිග අඩි 6 | 590.00 | - | 2700.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා මිල ගණන් සපයා ඇති "තෙෂාරා හාඩ්වෙයාර්,නාවලපිටිය". යන ආයතනයේ අදාල මිල දී ගැනීම් සිදු කිරිමට සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 10 බල ප්‍රදේශයේ සීමා සලකුණු නම් කිරිමේ පුවරු සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.

| ලක් රූ,රඹුක්පිටිය,නාවලපිටිය | සම්පත් වැල්ඩින්,අඹගමුව පාර,නාවලපිටිය | කුමාර ස්ටිකර් හා වැල්ඩින්,කොත්මලේ පාර,නාවලපිටිය |
|---|---|---|
| 44500.00 | 46500.00 | 47000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා මිල ගණන් සපයා ඇති "ලක් රූ,රඹුක්පිටිය,නාවලපිටිය". යන ආයතනයේ අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 11 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ උඩු මහල සඳහා ලෙක්චර් පුටු මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටර්ස්,නාවලපිටිය | ජයන්ති ටිම්බර් ඩිපොට්,නාවලපිටිය |
|---|---|---|
| 22960.00 | 23000.00 | 23200.00 |

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.00 පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
කඩියන්ලෙන ඉදලා නාවලපිටියට යන්න බෑ සභාපතිතුමා පාර කැඩිලා.ඒ වගේම පාරවල් නම් කරලා පුවරු ගහනකොට ප්‍රමිතියක් නෑ.විධිමත් ආකාරයට ඒ වැඩේ කරනවා නම් හොදයි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙමු කඩියන්ලෙන නාවලපිටිය පාර සම්බන්ධයෙන්.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
පැළ වර්ග සිටුවීම සම්බන්ධයෙන් අදහස් දැක්වීමක් මෙම මන්ත්‍රීතුමිය විසින් සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
විදාතා මධ්‍යස්ථානයෙන් කොස් වලින් ආහාර නිෂ්පාදනය කරන ව්‍යාපෘතියක් කරනවා.අටුකොස් වලට විශේෂ පුහුණුවක් ලබා දෙනවා.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
අපිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කිව්වා ප්‍රාදේශීය සභාවෙනුත් පුහුණු වැඩසටහනක් තියෙනවා කියලා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
තවම තිබුනේ නෑ ඒක.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
කිරි ගවයින් ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා කිව්වා.ඒ වැඩසටහන කෙරෙනවද?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.තව මාසයක් විතර යයි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
ගරු සභාපතිතුමනි,ගලබඩ තේ වත්තෙන් ක්‍රිස්බෝ එකට ඉඩම් දීලා තියෙනවා.ඒවට අක්කර බදු මුදල් අය වෙනවද?ගෝනාවලපතන ක්‍රීඩා පිට්ටනිය කැපුව එකේ මුදල් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ගෙව්වද?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අක්කර බදු මුදල් අය වෙනවා.ක්‍රීඩා පිට්ටනියේ මුදලුත් ලැබුණා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
මට ස්තූතියක් පළ කරන්න ඕනි.මාගේ මවගේ අසනීප වී සිටි මොහොතේ සිට අභාවය දක්වා මා සමග දුක බෙදා ගනිමින් සිටි ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පළ කරනවා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා පෙ.ව 11.48 පමණ සභා ගර්භයෙන් පිටව යන ලදී.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සිරිසේන මන්ත්‍රීතුමාගේ මවගේ අභාවය වෙනුවෙන් ගරු සභාවේ ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
ගිය අයවැය සම්බන්ධයෙන් කථා කරනකොට අපි අනුමැතිය දුන්නේ සභාවේ කටයුතු අවිච්ජින්ව පවත්වාගෙන යන්න අවශ්‍ය කරන වියදම් වලට පමණයි.ක්‍රීඩාවලින් දක්ෂතා ඇති දරුවට මුදල් ලබා දෙන්න යෝජනා ස්ථිර කරා.එහෙම තියෙද්දී කොහොමද ඒ දරුවට මුදල් ලබා දෙන්නේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සියලු වියදම් වලට අනුමත කරලා පසුව ලිපියක් එව්වා මන්ත්‍රීතුමිය.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
වැවේගම වතුර ගැටලුව ගැන කථා කලාට මාසයක් වෙනවා අපිට බොන්න වතුර නෑ.බිල නම් මං ගෙව්වා.වැල් කඩලා.නීතිය ක්‍රියාත්මක කරන්නෙත් නෑ සභාවෙන් මැදිහත් වෙලා.හරිත ලංකා වැඩසටහන යටතේ මට තොරතුරක් ලැබුණා නිවාස 25 ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා කියලා.එහෙම දෙයක් වෙනවද නැද්ද කියලා දැනගන්න ඕන.එහෙම ලබා දෙනවනම් නිවාස ලබා දීමේ ක්‍රමවේදය ගැන දැනගන්න පුලුවන්ද?විදාතා එකේ පුහුණු වැඩසටහනක් තිබුණා කියලා මන්ත්‍රීතුමත් කිව්වා.අපිවත් ඒ සමබන්ධයෙන් දැනුවත් කරනවනම් හොදයි.කමිටු පත් කිරිම ගැන නිතරම කිව්වා මං.ඒ නිසා මේ වෙලාවේ යෝජනාවක් විධියට මං කරනවා චන්ද්‍රිකා මන්ත්‍රීතුමියත් මමත් පරිසර කමිටුවට ඇතුළත් කරගන්න කියලා.ගලබඩ දිය ඇල්ලේ ආදායම අපිට ගිය මාසේ ලබා දුන්නේ නෑ.අපි ඊයේ ජාතික ගොවි සංගමයේ සභාපතිතුමත් එක්ක මිරිස් වගාව බලන්න ගියා.කෘෂිකර්ම ඇමතිතුමාගෙනුත් අවසර අරගෙන ආවේ.එයාලත් එක්ක මමත් සම්බන්ධ උනා.අපිට එතනට යන්න දුන්නෙත් නෑ.අපේ මන්ත්‍රී දෙපලකුත් සම්බන්ධ උනා.අපි කිසිම දෙයක් විනාශ කරන්න ගියා නෙවෙයි.අපිට බහින්න වත් දුන්නේ නෑ.වීඩියෝ දර්ශන තියෙනවා අපි ළඟ.අවසර අරගෙන එන්න කියනවා එයාලා.අපිට සභාපතිතුමා වත් කියලා නෑ කාගෙන්ද අවසර ගන්න ඕනි කියලා.ඒ ව්‍යාපෘතිය ඔබතුමාගේ වත් ඇමතිතුමාගේ වත් පෞද්ගලික ධනයෙන් කරපු එක්ක නෙවෙයිනේ.මේක බලන්න එපා කියලා කියන්නේ ඇයි කියලා මට තේරෙන්නේ නෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
වෘත්තීය සමිති වල අය එක්කන් ඇවිල්ලා මේ වැඩේ කඩාකප්පල් කරන්න ගියේ.කරන දෙයක හොදක් දකින්න පුරුදු වෙන්න.හැමදේකම අඩුපාඩුවක් හොයන්න එපා.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
දෙකිද කාපට් පාරේ අලුත්ගම හන්දියේ වළක් හෑරිලා තියෙනවා.ඒක මාර්ග සංවර්ධන අධිකාරියට වත් දැනුම් දෙන්න.අනතුරක් සිදු වෙන්න ඉඩ තියෙනවා ඒකෙන්.ළමා හා කාන්තා කමිටුව සඳහාත් අපේ සභාවේ මන්ත්‍රීවරියන් 04 දෙනාගේ නම් මං යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී.පුෂ්පකුමාර මහතා</u>
කෘෂිකර්ම අමාත්‍යාංශය මහින්දානන්ද මැතිතුමාට දුන්නට පස්සේ තමයි නාවලපිටියට කෘෂිකර්මයෙන් විශාල දියුණුවක් ඇති උනේ.මිරිස් බීජ වගා ව්‍යාපෘතියෙන් ගොවීන් විශාල ප්‍රමාණයකට රැකියා අවස්ථා හා ඔවුන්ට විශාල ආදායමක් ලැබුණා.බදු පදනම මත තමයි මේ ඉඩම් ලබා ගත්තේ.පළමු වටය අවසන් වෙලා දැන් දෙවනි වටයත් ආරම්භ කරලා තියෙන්නේ.මිරිස් ව්‍යාපෘතියේ මාර්ගය සකස් කිරිමට නොහැකි උනේ දැනට පවතින භාණ්ඩ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ටෙන්ඩරය අවලංගු උනා.තාවකාලිකව ඉදිකිරිම් කටයුතු අවලංගු උනා.ලංකාවෙම අය ගලබඩ ගැන කථා කරනවා.දේශපාලන වාසි නිසා මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට මඩ ගහන වැඩසටහනක් තමයි කරන්න ගියේ.ඊයේ මේ පිරිස ගියේ විරෝධතාවයක් කරන්න.වැරදි හොයන්න තමයි ගියේ.රසික මහතාගෙන් තමයි අවසරය ගන්න ඕනි.අපි ගොවි සමිතියක් ආරම්භ කළා.කිසිම දැනුම් දීමක් නැතුව තමයි මේ පිරිස ගිහින් තියෙන්නේ.බලන්න ඕනි නම් අපි ඒකට ක්‍රමවේදයක් හදලා තියෙනවා.මටත් කථා කරානම් මාත් එනවනේ යන්න.ඔබතුමියලා ගියේ මේකට හානියක් කරන්න.මේක හොඳ ව්‍යාපෘතියක්.ඇමතිතුමා ඉඩම් විකුණලා කියලා මඩ ගහන්න තමයි ඕනි වෙලා තියෙන්නේ.ලංකාවටම කිරි නිෂ්පාදන පුලුවන් මට්ටමට ගලබඩ සංවර්ධනය කරන්න යන්නේ.කිරි හරක් 2000 ක් ගේනවා අපි.පරිසරවේදීන් කිව්වට මේ ව්‍යාපෘතියෙන් පරිසරයට හානියක් වෙනවා කිව්වට එහෙම වෙන්නේ නෑ.හොඳ දේට හොඳයි කියන්න පුරුදු වෙන්න.පක්ෂ දේශපාලනය අයින් කරලා හොඳ දේට උදව් කරන්න කියලා මං ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
කනගාටුවෙනවා අපි ඒක විනාශ කරන්න ගියා කියන එකට.අපි අගය කරලා තියෙනවා හිටපු කෘෂිකර්ම ඇමතිතුමා කරපු වැඩේ.අපි දැන් ඉන්න කෘෂිකර්ම ඇමතිතුමාට කිව්වා ඒ ව්‍යාපෘති විනාශ කරන්න දෙන්න එපා කියලා.වැරදි අවබෝධයක් ඇති වෙලා තියෙන්නේ.අපි අගය කරපු දේ ගැන තොරතුරු ඔබතුමාට ඇවිත් නෑ.එයාලත් පිළිගත්තා මේක සාර්ථක ව්‍යාපෘතියක් කියලා.දොලොස්බාගේ පාරේ වරකාවලට පිවිසෙන පාරේ වතුර බට දාන්න කියලා පාර කඩලා.මං ගියා පසුගිය සතියේ බලන්න.පාර කැඩිලා හේදිලා ඇවිල්ලා.ඒකට පිළියමක් කරන්න.වතුර බට තැන් තැන්වල දාලා.විනාශ උනොත් අපරාදේ.පාර කඩලා බට දානවට වැඩිය විකල්පයකට යනවා නම් හොඳයි.පුස්තකාල පරිශ්‍රයේ පුවරු සවි කරමු කිව්වට තවම ඒ වැඩේ වෙලා නෑ.ශ්‍රමදානය උනා.ඖෂධ උයන හදන වැඩෙත් යනවා. පෙර පාසල් වලට මුදලක් වැඩි කරන්න කියලා කිව්වට අපිට තියෙන්නේ එක පෙර පාසලයි.අනිත් පෙර පාසල් වල කොහොමද වෙන්නේ කියලා දැනගන්න කැමතියි.අපිට ඒකට මැදිහත් වෙන්න පුලුවන්ද කියලා දැනගන්න කැමතියි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පෙර පාසල් සංසදයෙනුත් කැමති උනා කියලා තමයි කිව්වේ.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
දැනට සංවර්ධන වැඩ සියලු දේවල් නවත්තලා තියෙන්නේ.ජල සම්පාදනයෙනුත් සංවර්ධන වැඩ නවත්තලා තියෙන්නේ.වරකාව පාරවල් වල දෙපැත්තෙම ගෙවල් තියෙන්නේ.එකම බෑම්ම.වරකාව ඉදලා යකඩ බටයක් යනවා පල්ලේගමට.ඒ බටේ නිසා පාර කඩාගෙන තමයි යන්න වෙන්නේ.ඒ වැඩේ නවත්තලා තියෙන්නේ දැන්.ජල සම්පාදනයෙන් කිව්වා ඉතිරි උන සල්ලි ටිකක් තියෙනවා කැඩුණු පාරවල් ටික හදලා දෙන්නම් කියලා.අඩි 5ක් විතර කාණුව ගැඹුරුයි.පාරත් පටුයි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
පසුගිය දවසක අපි උත්සවයක් කළා.බාලිකාවේ දරුවෙක් ඉන්නවා ක්‍රීඩාවට ඉතාමත් දක්ෂ.ඇමතිතුමා විශාල දායකත්වයක් දුන්නා ඒ දරුවට අවශ්‍ය දේවල් අරන් දෙන්න.ඒකට ස්තුතිවන්ත වෙන්න ඕනි.නගර සභාවේ සභාපතිතුමත් උදව් කරා.

<u>ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය</u>

වරකාවේ පාලම දැන් හොඳටම අබලන්.කොන්ත්‍රාත්තුව ගත්ත කෙනා ළග ලෑලි ටිකක් තියෙනවා.ඕනි නම් දෙන්න පුලුවන් කියලා කිව්වා.ඒ පාලම සකස් කරලා දෙන්න පුලුවන් නම් හොඳයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
චන්ද්‍රිකා මන්ත්‍රීතුමිය කිව්ව වරකාව පාර ගැන ගැටලුවක් තියෙනවා.අපි පාර කාපට් කරන්න ඔක්කොම කරලා තිබුණා.ඒ අතරේ තමයි ජල යෝජනා ක්‍රමය ආවේ.ජල සම්පාදනය කැමති නෑ පෞද්ගලික ඉඩම් වලින් ගන්න.කොත්මලේ ප්‍රාදේශීය සභාවට තමයි පාලම අයිති.අපි ඔබතුමියගේ ඉල්ලීම දැනුම් දෙන්නම්.වැවේගම වතුර බටේ දැම්මේ ශිරෝමි මන්ත්‍රීතුමියට ඕනි විදියටමයි.දැන් වැල් එක කඩලා කිව්වට ඒක කරපු කෙනා හොයාගන්න සහයෝගයක් දෙන්න.ඉතිරි ටික අපි කරන්නම්.හැම ගමකම හැම ග්‍රාම සේවා වසමකම ඇමතිතුමා බලාපොරොත්තු උනේ බීජ නිෂ්පාදනය.අපි මුලින් 100% බීජ ගෙනාවේ පිටරටින්.ඒක නවත්වන්න තමයි ඕනි උනේ.ගලබඩ කිරි ගව ව්‍යාපෘතිය ඉතා දැවැන්ත ව්‍යාපෘතියක්.පිටරටින් ගේන කිරි බීලා දරුවෝ රෝගීන් වෙනවා.ඒවට විශාල වශයෙන් කල්තබා ගැනීමේ ද්‍රව්‍ය ඇතුළත් වෙනවා.ඒ ව්‍යාපෘතියේ අක්කර 600 ක් තණකොළ හිටවනවා.ගව අපද්‍රව්‍ය ඉවත් කරන්න ක්‍රමවේදයක් තියෙනවා.විධිමත් විදියට තමයි මේක කරන්නේ.රුපියල් මිලියන 3000 ක් වියදම් කරනවා මේ ව්‍යාපෘතියට.පරිසරවේදීන් නිසා තමයි සංවර්ධනයක් කරන්න බැරි.